ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ සන්නිවේදන දෙපාර්තමේන්තුව

දිනය 2016 ජූලි 4

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි සිය රාජකාරී කටයුතු ඇරඹීම**



*ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මුදල් නෝට්ටු සඳහා සිය ආදර්ශ අත්සන තබන අයුරු*

1949 අංක 58 දරන මුදල් නීති පනතේ ප්‍රතිපාදනවලට අනුකූල ව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අධිපතිවරයා ලෙස ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි පත්කරන ලදී. මේ අනුව ආචාර්ය කුමාරස්වාමි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් ද කටයුතු කරනු ඇත.

වර්ෂ 1974 සිට 1989 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික නිලධාරියෙකු වශයෙන් කටයුතු කළ ආචාර්ය කුමාරස්වාමි ආර්ථික පර්යේෂණ, සංඛ්‍යාන හා බැංකු අධීක්ෂණ යන දෙපාර්තමේන්තුවල සේවය කළ අතර 1981 සිට 1989 කාලය තුළ මුදල් අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලදී.

1990 සිට 2008 දක්වා කාලය තුළ පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයේ විවිධ තනතුරු දැරූ ඒ මහතා එහි ආර්ථික කටයුතු අධ්‍යක්ෂ හා පොදු රාජ්‍ය මණ්ඩල මහ ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ යන තනතුරු ද හෙබවී ය. මීට අමතර ව ආචාර්ය කුමාරස්වාමි 2010 ජනවාරි මස සිට ජූලි මස දක්වා පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයේ සමාජ පරිවර්තනය සඳහා වූ වැඩසටහන් අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කර ඇත. ආචාර්ය කුමරස්වාමි 2013 ජනවාරි මස සිට 2015 ජනවාරි මස දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළ අතර සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ උපදේශකවරයකු ලෙස ද මෑතක් වනතුරු කටයුතු කළේ ය.

සිය ප්‍රථම උපාධිය එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙන් හිමිකරගත් ඒ මහතා සසෙක්ස් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ද ලබාගත්තේ ය.

සී ආර් සහ එෆ් සී කණ්ඩායම නියෝජනය කළ ප්‍රවීණ රග්බි ක්‍රීඩකයකු වූ ආචාර්ය කුමාරස්වාමි ශ්‍රී ලංකා ජාතික රග්බි කණ්ඩායම ද නියෝජනය කළේ ය. ඒ මහතා ටැමිල් යූනියන් ක්‍රීඩා සමාජය නියෝජනය කළ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයකු ද වෙයි.